# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 11 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

**ඒකකය : දළද පෙරහැර**

**පෙරවදන**

“...සකල ලෝ වැසි බුදුනුවන්ගේ අනන්ත ගෞරවාදරයට පාත්‍ර වන ගෞතම බුදුන් වහන්සේ පිළිබඳ ධාතුහු තෛවර්ගයක් වෙති. ශාරීරික ධාතු, පාරිභෝගික ධාතු, උද්දේසික ධාතු යනු ඒ තෛවර්ගය යි. කන්ද උඩරට සෙංකඩගල රාජධානියේ අගනුවර වූ මහනුවර දළඳා මන්දිරයේ වැඩ සිටින මාළිගාව නම් වන දෙමහල් මැඳුරෙහි උඩු මහලේ කුටියක් තුළ රනු කරඬු සතකින් සුරක්ෂිත වූ සුමුගක තැන්පත් කොට ඇති දළඳාව වූ කලී ශාරීරික ධාතුවකි. බුදුන් වහන්සේ කෙරෙහි පවත්නා අප්‍රමාණ වූ ද, අනුපමේය වූ ද, භක්තියත් ගෞරවයත් නිසා දළඳා වහන්සේ මෙසේ අත්‍යන්ත ගෞරව සම්ප්‍රයුක්තව දළඳා මන්දිරයේ තැන්පත් කොට පුද පූජා පවත්වනු ලැබේ...”

- ඇසළ මාසයේ දී ලක්දිව විවිධ ප්‍රදේශ වල පෙරහැර පැවැත්වේ. එහිදී විවිධ දෙවි දේවතාවුන් වහන්සේලා හා පූජා වස්තු බැතිමතුන්ගේ ගෞරවයට පාත්‍ර වේ.

**<u>01. ක්‍රියාකාරකම</u>**

1. පහත දැක්වෙන පෙරහර පැවැත්වෙන ස්ථාන සහ එහි දී ගෞරවාදරයට පාත්‍ර වන දෙවි දේවතාවුන් හා පූජා වස්තු ගැළපෙන පරිදි යා කර දක්වන්න.

| | | |
|---|---|---|
| 1. | මහනුවර → | දළඳා වහන්සේ |
| 2. | දෙවුන්දර | ඇඩිමුණ්ඩ දෙවියෝ |
| 3. | අලුත්නුවර | විෂ්ණු දෙවිඳුන් |
| 4. | නවගමුව | සමන් දෙවියෝ |
| 5. | රත්නපුරය | ස්කන්ධ කුමාර දෙවියෝ |
| 6. | කතරගම | පත්තිනි දේවතාවිය |

2. ඉහත ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීමෙන් පසුව දළඳා පෙරහැර පැවැත්වීම පිළිබඳව ඔබට එළඹිය හැකි නිගමනයක් ලියන්න.

..................................................................................................................................

..................................................................................................................................

<u>අවබෝධය</u>

**02. පාඩම හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

1. ඇසළ පෙරහරේ ආරම්භය පිළිබඳ දැක්වෙන මත 3 ලියන්න.

   ..................................................................................................................

2. වර්තමාන මහනුවර පෙරහරේ ආරම්භය සිදුවන්නට ඇතැ යි සැලකෙන්නේ කිනම් කාල කාල වකවානුවක දී ද?

   ..................................................................................................................

3. ආරම්භක අවස්ථාවේදී එහි පැවති සතර දේවාල පෙරහැර මොනවා ද?

   ..................................................................................................................

4. සතර දේවාල පෙරහැර වලට දළඳා මාළිගාවේ පෙරහැර එක්කරන්නට අනුශාසනා දුන් ස්වාමීන් වහන්සේගේ නම කුමක් ද?

   ..................................................................................................................

5. එය ක්‍රියාවට නැංවූ රජතුමා කවරෙක් ද?

   ..................................................................................................................

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල

6. 1828 මැයි 29 දින දළදා පෙරහර පවත්වන්නට අවසර දුන් ආණ්ඩුකාරවරයා කවරෙක් ද?
…………………………………………………………………………………………….......
7. ඇසළ පෙරහැර චිත්‍රයට නැගූ මුල්ම විදේශිකයා නම් කරන්න.
…………………………………………………………………………………………….......
8. ඇසළ පෙරහැර ඇසින් දුටු ඉංග්‍රීසි ජාතික සංචාරකයා කවරෙක්ද?
…………………………………………………………………………………………….......
9. ස්වකීය ලේඛනවල ඇසළ පෙරහැර ගැන තොරතුරු සඳහන් කළ විදේශිකයන් තිදෙනකු නම් කරන්න.
……………………………………………………………………………………………..
10. ඇසළ පෙරහරේ අසිරිය හා සැරසිලි පිළිබඳ තම දේශාටන වාර්තා වල සටහන් කළ දෙදෙනා නම් කරන්න.
…………………………………………………………………………………………......

<u>අවබෝධය</u>

**03. ඇසළ පෙරහැරේ අංගවල සංකේතාත්මක අර්ථ කිහිපයක් පහත දැක්වේ. ඒවා සුදුසු පරිදි යා කොට දක්වන්න.**

| | | | |
|---|---|---|---|
| 1. | ඉන්ද්‍ර දෙවියන්ගේ වැසි වළාකුළු හා රජුගේ ශක්තිය | A | රජතුමා |
| 2. | වැස්සට අධිපති ඉන්ද්‍ර දෙවියන්ගේ නියෝජිතයා | B | බෙරහඬ |
| 3. | වැස්ස ආශ්‍රිත විදුලි කෙටීම් | C | අලි ඇතුන් |
| 4. | වැස්ස ආශ්‍රිත ‍ෙහන හඬෙහි දෝංකාරය | D | දිය කැපීම |
| 5. | අසුරයන් මැරූ කඩු සූරයන් විසින් සේදීම | E | කස පිපිරවීම |

<u>ක්‍රියාකාරකම</u>

**04. දළඳ මැඳුරේ රාජකාරි හා ඒ සම්බන්ධ නිලධාරින් ඇතුළත් කාඩ්පත් කිහිපයක් දරුවකු වූ සකස් කළේ පහත පරිදිය. ඒ කාඩ් වල් හිස්තැනට අදල අක්ෂර ලියමින් නිලධාරීන්ගේ නාම සම්පූර්ණ කරන්න.**

1. දළදා මාලිගාවේ පරිපාලන පද්ධතියේ ප්‍රධානියා

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දි | | | | | | | මේ |

2. දළදාව උදෙසා දාන වස්තු පිළියෙල කිරීම භාරව කටයුතු කරන්නා

| | | | | | |
|---|---|---|---|---|---|
| මු | | | | රා | |

3. දළදා තේවා අවස්ථාවලදී සක් පිඹින්නා

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක් | ගෙ | | | |

4. දළදා මාලිගාවේ චාරිත්‍ර වාරිත්‍ර සඳහා නැකැත් සාදන්නා

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| නැ | | | මො | | | | |

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල

5. ඇතුන් පිළිබඳ වගකීම් දරන්නා

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | නා | | | නි | | මේ |

6. වී අටුවට ගෙනයාම, තේවාවට සහාය වීම

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ප | | | මා | | රා | |

7. දියවඩන නිලමේ තුමාගේ ද්විතීය නිලධාරියා

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කා | | | | | | | රා | |

8. වැඩසිටින මාලිගාවේ යතුරු පිළිබඳ වගකීම් භාරකරු

| | | | | | |
|---|---|---|---|---|---|
| ව | | | රු | | |

**05. පහත සඳහන් කියමන් නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද අදාල කොටුවේ සටහන් කරන්න.**

1. පැරණි දළදා පෙරහැර රාජ්‍ය බලය පෙන්වීමේ අවස්ථාවක් වූ බව වාර්තා වල දැක්වේ. ☐
2. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඇත් පෙරහරේ එක් පසෙකින් රන්දෝලි ගෙන යාමට අවසර දෙන ලදී. ☐
3. දිය කැපීමේ මංගල්‍යය සිදුවන්නේ ගැටඹේ තොටේ දී ය. ☐
4. දිය කැපීමෙන් පසු පෙරහැර කතරගම ගණදෙවි කෝවිලට පැමිණ පූජා පවත්වයි. ☐
5. ගජබා රජු සමග සොලී රටට යද්දී නීල මහා යෝදයා කඩුවකින් ගසා මුහුද දිය දෙබෑ කළේය ලු. ☐
6. වලියක් නැටුම විෂ්ණු දේවාලයේ දින හතක් පුරා කෙරෙන ශාන්තිකර්මයකි. ☐
7. දළදා පෙරහැර අවසන් වන්නේ වස්දොස් හැරීම සඳහා වන ගරායක් නැටුමෙනි. ☐
8. “රන්දෝලි” පෙරහැර පස් වන දින රාත්‍රියේ අවසන් වූ පසු අස්ගිරි විහාරයේ ආදාහන මළුව විහාරයෙහි කරඬුව තැන්පත් කරයි. ☐
9. ඇතැම් ප්‍රදේශවල පෙරහැරවලදී අලියා වෙනුවට ගවයා යොදා ගනී. ☐
10. 1828 මැයි 29 වන දින පැවැත්වුණු දළදා පෙරහැර පිළිබඳ ලිඛිත විස්තරයට අනුව පෙරහැර ආරම්භ වී ඇත්තේ යුද්ධචාර මධ්‍යයේ ය. ☐

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල

<u>අවබෝධය</u>

**06. පහත ප්‍රකාශයන්ගෙන් කියවෙන දළද පෙර පෙරහැර අවස්ථාවන් හඳුන්වන ව්‍යවහාර වරහන් තුළින් තෝරා තිත්ඉරි මත ලියන්න.**

1. ඇසළ මස අමාවක දිනට දින කිහිපයකට පෙර පල හට නොගත් කොස් ගහකට පුද පූජා පවත්වා දේව ආයාචනයක් කොට එම ගස කපා කඳෙන් රියන බැගින් පෙරහැරකින් ගෙන ගොස් සතර දේවාල කුටි වල සිටුවීම.

   ..............................................................................................................................................

2. සතර දේවාලයේ කපුවන් දේවාලයට අයත් රන් ආයුධ කප වටා වැඩම කරවන පෙරහැර.

   ..............................................................................................................................................

3. සතර දේවාලවල බස්නායක නිලමේවරුන් රන්සිවි ගෙයක රන් ආයුධ හිඳුවා ඇතුපිට තබා පෙරහැරින් අවුත් දේව සංහිඳේ දී දළදා කරඬුව සහිත රන්සිවි ගෙය වැඩමවන මාලිගාවේ ඇතා ප්‍රමුඛ පෙරහැර.

   ..............................................................................................................................................

4. සතර දේවාලයන්හි දේවාභරණ වැඩමවන වාහන හා රන්දෝලි කුඹල් පෙරහැර අගට එක්කරන දළඳා පෙරහරේ කූඨප්‍රාප්තිය ලෙස සැලකෙන අසිරිමත් පෙරහැර.

   ..............................................................................................................................................

5. දේවාලයවල කපු මහත්වරු ගඟ මැදට ගමන් කර පෙරහැරට සිට වූ කප සහ ගිය වර්ෂයේ ලබාගත් ජලය ගං දියට දමා රන් කඩුවෙන් ගඟ දිය දෙබෑ කර කෙණ්ඩියට ජලය පුරවා ගැනීම.

   ..............................................................................................................................................

6. අස්ගිරි විහාරයේ දී සූදානම් වන දළදා පෙරහැර හා සිව් දේවාල පෙරහැර ද එක්වී වීථි සංචාරය කොට සුබ මොහොතින් දළදා මාලිගාවට ප්‍රවිෂ්ට වන පෙරහැර.

   ..............................................................................................................................................

   (රන්දෝලි පෙරහැර, කුඹල් පෙරහැර, දවල් පෙරහැර, කප් සිටුවීම, දියකැපීම, දේවාල පෙරහැර)

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල